**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023

නොවැම්බර් - 2025

## BMGT E3065 - ව්‍යාපාර මූල්‍ය

i. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සමන්විත වේ. ('අ' සහ 'ආ' කොටස)

ii. ප්‍රශ්න ගණන :

'අ' කොටස - 10 (බහුවරණ ප්‍රශ්න)

'ආ' කොටස - 04

iii. සියලුම ප්‍රශ්න අනිවාර්ය වේ.

iv. 'අ' කොටසෙහි පිළිතුරු පොතට අමුණන්න.

v. ප්‍රශ්න පත්‍රයේ 'අ' කොටස විභාග ශාලාවෙන් පිටතට රැගෙන යාම සපුරා තහනම් වේ.

### 'අ' කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) මූල්‍ය කළමනාකරණය සැලකිලිමත් වන්නේ,

අ) යම් සමස්ත ඉලක්කයක් මනසේ තබාගෙන වත්කම් අත්පත් කරගැනීම, මූල්‍යකරණය සහ කළමනාකරණය කිරීම.

ආ) පවතින සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් ලාභය උපරිම කිරීම.

ඇ) ආර්ථිකයේ පවතින සම්පත් ප්‍රශස්ත ලෙස ප්‍රයෝජනයට ගැනීම.

ඈ) ආයතනික සහ කොටස් හිමියන්ගේ අරමුදල් අවශ්‍යතා හඳුනාගැනීම.

(02) ආයෝජනය අර්ථ දැක්විය හැක්කේ,

අ) ප්‍රාග්ධන කොටස් වෙත සිදුකරන ලද ශුද්ධ එකතු කිරීම.

ආ) මහල් නිවාසයක් හෝ නිවසක් මිලදී ගැනීමට පුද්ගලයෙකුගේ කැපවීම.

ඇ) ප්‍රතිලාභ උපයාගැනීම සඳහා වත්කම් මත අරමුදල් යෙදවීම.

ඈ) නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා කරන භාණ්ඩ හා සේවා සඳහා අරමුදල් යෙදවීම.

03) සම්මත අපගමනයෙන් මනිනු ලබන්නේ,

අ) ආයෝජනයේ ප්‍රතිලාභය

ආ) රඳවාගත් ප්‍රතිලාභය

ඇ) ලාභාංශ ප්‍රමාණය

ඈ) අවදානම

04) මුදලේ කාලීන අගය විවිධ කාලසීමාවන්හි මුදල් ප්‍රවාහ සංසන්දනය කිරීම සඳහා යොදාගනු ලබන්නේ,

අ) සියලුම මුදල් ප්‍රවාහ එකම කාලවකවානුවකට වට්ටම් කිරීම මගිනි.

ආ) සියලුම මුදල් ප්‍රවාහ එකම කාලවකවානුවකට සංගුණනය කිරීම (compounding) හෝ වට්ටම් කිරීම (discounting) මගිනි.

ඇ) සියලුම මුදල් ප්‍රවාහ එකම කාලවකවානුවකට සංගුණනය කිරීම මගිනි

ඈ) ඉහත කිසිවක් නොවේ.

(05) ඔබ රුපියන් 10,000 ක මුදලක් 12% ක අර්ධවාර්ෂිකව පොලිය සංගුණනය වන ගිණුමක තැන්පත් කිරීමට එකඟවූයේ නම්, ඔබේ තැන්පතුව රු. 16,000 ක් වීමට ගතවන කාලය වන්නේ,

අ) අවුරුදු 4

ආ) අවුරුදු 1 යි මාස 02

ඇ) අවුරුදු 2

ඈ) අවුරුදු 1 යි මාස 04

(06) සමාගමක ස්ථාවර නිෂ්පාදන පිරිවැය මගින් සෘජුව බලපෑමට ලක්වන උත්තෝලනය (Leverage) කුමක්ද?

අ) මෙහෙයුම් උත්තෝලනය (Operating Leverage)

ආ) මූල්‍ය උත්තෝලනය (Financial Leverage)

ඇ) එකතුවූ උත්තෝලනය (Combined Leverage)

ඈ) කිසිවක් නොවේ.

(07) 2025 වර්ෂය සඳහා මූල්‍ය උත්තෝලන අනුපාතය (Degree of Financial Leverage - DFL) ගණනය කරන්න.

| වසර | විකුණුම් (රු.) | EBIT (පොලී සහ බදු පෙර ආදායම) (රු.) | EPS (කොටසකට ඉපැයුම) (රු.) |
|---|---|---|---|
| 2024 | 2,000 | 800 | 12 |
| 2025 | 1,200 | 400 | 6 |

අ) 1.25

ආ) 1.0

ආ) 1.5

ආ) 2.0

(08) ස්ථාවර ලාභාංශ ප්‍රතිශත ප්‍රතිපත්තිය (Constant Payout Ratio Policy) යටතේ සමාගම,

අ) වසරකට ස්ථාවර ලාභාංශ මුදලක් ගෙවයි

ආ) ඉපැයීම් වල ස්ථාවර ප්‍රතිශතයක් ලාභාංශ ලෙස ගෙවයි

ඇ) කොටස් මිල පවත්වා ගැනීම සඳහා ලාභාංශ සකසයි

ඈ) කොටසකට ඉපැයුම (EPS) වැඩි වූ විට පමණක් ලාභාංශ ගෙවයි

(09) කොටස් ලාභාංශ (Stock Dividends) යනු,

අ) කොටස් වෙනුවට මුදල් ගෙවීමකි.

ආ) මුදල් ලාභාංශ වෙනුවට නව කොටස් නිකුත් කිරීමකි.

ඇ) බැදුම්කර (Bonds) ලෙස බෝනස් ගෙවීමකි.

ඈ) සමාගම විසින් තමන්ගේම කොටස් නැවත මිලදී ගැනීමකි.

(10) ජංගම වත්කම් (Current Assets) වල උචිත මට්ටම (Optimal Level) සොයා ගනු ලබන්නේ,

අ) තබා ගැනීමේ පිරිවැය (Carrying Cost) 0 ට සමාන වන විට

ආ) අඩුපාඩු පිරිවැය (Shortage Cost) 0 ට සමාන වන විට

ඇ) මුළු පිරිවැය (තබා ගැනීමේ + අඩුපාඩු) අවම වන විට

ඈ) මුදල් ශේෂය (Cash Balance) ගෙවිය යුතු ගිණුම් ශේෂයට සමාන (Accounts Payable) වන විට

## 'ආ' කොටස

**ප්‍රශ්න අංක 01**

අ) මූල්‍ය ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය අතර වෙනස පැහැදිළි කරන්න.

(ලකුණු 05)

ආ) ව්‍යාපාර මූල්‍ය විෂය ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබ විශ්වවිද්‍යාලය අසල ලිපිද්‍රව්‍ය වෙළඳසැලක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම්, මෙම විෂය ඒකකයෙන් ලබාගත් මූල්‍ය තීරණ පිළිබඳ දැනුම ඔබ මෙම කාර්යය සඳහා යොදාගන්නේ කෙසේද?

(ලකුණු 05)

ඇ) සමාගම නිෂ්පාදන කටයුතු සඳහා වඩාත් සුදුසු යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා නව යන්ත්‍ර දෙකක් ඇගයීමට අපේක්ෂා කරයි. එක් යන්ත්‍රයක වටිනාකම රු. 250,000 වන අතර යන්ත්‍ර දෙකෙහිම ආයු කාලය වසර 05 බැගින් වේ. යන්ත්‍ර දෙක සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. යන්ත්‍ර දෙකෙහි සුන්බුන් අගයන් පහත පරිදි වේ.

| **යන්ත්‍රය** | **A** | **B** |
|---|---|---|
| සුන්බුන් අගය | රු. 7,500 | රු. 5,000 |

A යන්ත්‍රය සඳහා පළමු වසරේ නඩත්තු වියදම් ලෙස රු. 25,000 වැය වවද එය වසරකට 7.5% කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. B යන්ත්‍රයේ වාර්ෂික නඩත්තු පිරිවැය පළමු වසරේදී, රු. 40,000 ක් වන අතර එය වාර්ෂිකව 10.5% කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නව යන්ත්‍ර මඟින් විචල්‍ය පිරිවැය අඩු කිරීමට ඉඩ ඇති බැවින්, භාවිතා කරන යන්ත්‍රය අනුව දායකත්වය වෙනස් වේ. එක් එක් යන්ත්‍රයෙන් ලැබෙන දායකත්වය (නඩත්තු පිරිවැය හැර) පහත පරිදි වගුගත කර ඇත. අරමුදල් ගලා ඒම එක් එක් වර්ෂය අවසානයේ සිදුවනු ඇතැයි උපකල්පනය කෙරේ.

| වර්ෂය | 01 | 02 | 03 | 04 | 05 |
|---|---|---|---|---|---|
| දායකත්වය - A යන්ත්‍රය (රු.'000) | 85 | 110 | 190 | 210 | 50 |
| දායකත්වය - B යන්ත්‍රය (රු.'000) | 50 | 145 | 75 | 160 | 210 |
| වට්ටම් අනුපාතය 12% | 0.893 | 0.797 | 0.712 | 0.636 | 0.567 |

ප්‍රාග්ධන පිරිවැය 12% ක් පමණ වනු ඇතැයි මූල්‍ය කළමනාකරු අපේක්ෂා කරයි. බදු නොසලකා හරින්න.
ඔබ විසින් පහත දෑ ගණනය කරන්න.

(i) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (ARR) යන්ත්‍ර A සහ B සඳහා

(ලකුණු 04)

(ii) ශුද්ධ වර්ථමාන අගය (NPV) යන්ත්‍ර A සහ B සඳහා

(ලකුණු 04)

(iii) ඉහත ගණනය කිරීම්වලට අනුව ඔබ තෝරා ගන්නේ කුමන යන්ත්‍රයද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 02)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) මුදලේ කාලීන වටිනාකම පිළිබඳ දැනුම උපයෝගී කරගනිමින් පහත ගැටළුවලට පිළිතුරු සපයන්න.

(i) 2024 අගෝස්තු 15 වන දින නදුන් ඔහුගේ සොයුරියගෙන් රු. 16,000 ක මුදලක් ණයට ඉල්ලා ගත්තේය. නදුන් 8% ක වාර්ෂික පොලී අනුපාතයක් ගෙවීමට එකඟ වූයේ නම් මාස 18 ක් සඳහා ඔහු ගෙවිය යුතු මුළු මුදල ගණනය කරන්න.

(ii) ඔබ රු. 9000 ක මුදලක් 15% වාර්ෂික පොලියක් ගෙවන ගිණුමක තැන්පත් කළේ නම්, වසර 12 කට පසුව ගිණුමේ කොපමණ මුදලක් තිබේද? (පොලිය අර්ධ වාර්ෂිකව සංගුණනය වේ.)

(iii) මාස 17 කින් රු. 25,000 ක මුදලක් ලබාගැනීමට නම් 23% වාර්ෂික පොලියක් ගෙවන ගිණුමක අද දින කොපමණ මුදලක් තැන්පත් කළ යුතුද? (පොලිය අර්ධ වාර්ෂිකව සංගුණනය වේ.)

(iv) ඔබ වසර 15 ක කල්පිරීමක් සහිත තැන්පතුවක රු. 4000 ක් ආයෝජනය කර 13% ක වාර්ෂික වැල් පොලියක් අඛණ්ඩව ලබා ගන්නේ යැයි සිතමු. මෙම ආයෝජනයේ අනාගත වටිනාකම ගණනය කරන්න.

(ලකුණු 02 x 04 = ලකුණු 08)

ආ) පසුගිය වසර හතර තුල R සහ S යන සුරැකුම්පත්වලින් ලද ප්‍රතිලාභ සහ එහි සම්භාවිතාවයන් පහත සඳහන් වේ.

| වසර | සුරැකුම්පත් R | | සුරැකුම්පත් S | |
|---|---|---|---|---|
| | සම්භාවිතාවය | ප්‍රතිලාභ (%) | සම්භාවිතාවය | ප්‍රතිලාභ (%) |
| 2024 | 0.10 | -18 | 0.05 | -15 |
| 2023 | 0.40 | 25 | 0.15 | 24 |
| 2022 | 0.15 | 13 | 0.35 | 30 |
| 2021 | 0.35 | 20 | 0.45 | 20 |

ඔබ විසින් පහත දෑ ගණනය කරන්න.

i. සුරැකුම්පත් R සහ S හි ප්‍රතිලාභය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. සුරැකුම්පත් R සහ S හි සම්මත අපගමනය

(ලකුණු 06)

iii. වඩාත්ම අවදානම ඇති ආයෝජනය කුමක්ද? ඔබේ පිළිතුර පහදන්න.

(ලකුණු 02)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) Ceylon Exports Ltd. සමාගම විසින් 2024 දෙසැම්බර් 31 අවසාන වන වර්ෂය සඳහා පහත මූල්‍ය තොරතුරු ලබා දී ඇත.

| | මුදල (රු. මිලියන) |
|---|---|
| ශුද්ධ ආදායම (Net Income) | 95,000 |
| ශුද්ධ විකුණුම් (Net Sales) | 800,000 |
| විකුණුම් පිරිවැය (Cost of Goods Sold – COGS) | 560,000 |
| වසර ආරම්භයේ මුළු වත්කම් (Total Assets – Beginning) | 500,000 |
| වසර අවසානයේ මුළු වත්කම් (Total Assets – End) | 600,000 |
| කෙටිකාලීන වත්කම් (Current Assets) | 240,000 |
| කෙටිකාලීන වගකීම් (Current Liabilities) | 120,000 |

| | |
|---|---|
| ආරම්භක තොගය (Inventory – Beginning) | 70,000 |
| අවසාන තොගය (Inventory – End) | 90,000 |
| මුළු වගකීම් (Total Liabilities) | 280,000 |
| සාමාන්‍ය කොටස් ගණන (Ordinary Shares Outstanding) | 40,000 |
| කොටසකට වෙළඳපල මිල (Market Price per Share) | රු. 25 |
| වාර්ෂික ලාභාංශය (Annual Dividend per Share) | රු. 3.00 |

ඉහත තොරතුරු භාවිතා කරමින් Ceylon Exports Ltd. සමාගම සඳහා පහත අනුපාතයන් (Accounting Ratios) ගණනය කරන්න.

i. දළ ලාභ අනුපාතය (Gross Profit Margin)

ii. ජංගම අනුපාතය (Current Ratio)

iii. වෙළඳ භාණ්ඩ පිරිවැටුම් අනුපාතය (Inventory Turnover Ratio / Merchandise Turnover)

iv. ණය අනුපාතය (Debt Ratio)

v. ලාභාංශ ප්‍රතිලාභ අනුපාතය (Dividend Yield Ratio)

(ලකුණු 02 x 05 = ලකුණු 10)

ආ) Delta Holdings PLC සමාගම අවශේෂ ලාභාංශ ආකෘතිය (Residual Dividend Policy) යටතේ ඉදිරි වසර සඳහා පහත මූල්‍ය තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| ප්‍රාග්ධන අයවැය (Capital Budget) | රු. 1,200,000 |
| ඉලක්ක ප්‍රාග්ධන ව්‍යුහය (Target Capital Structure) | 50% ණය (Debt), 50% කොටස් ප්‍රාග්ධන (Equity) |
| ඇස්තමේන්තුකළ ශුද්ධ ආදායම (Forecasted Net Income) | රු. 900,000 |

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන පහත දෑ ගණනය කරන්න.

i. අවශේෂ ලාභාංශ ආකෘතිය (Residual Dividend Model) භාවිතා කර ලාභාංශ ගෙවීම් මුදල (Dividend Payout Amount) ගණනය කරන්න.

(ලකුණු 04)

ii. ප්‍රාග්ධන අයවැය (Capital Budget) රු. 1,500,000 දක්වා වැඩි වුවහොත්, එම වෙනස ලාභාංශ ගෙවීම (Dividend Payment) මත ඇති බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 02)

(ඇ) "බීටා (Beta) යනු සමාගමක ප්‍රතිලාභය වෙළඳපලේ සමස්ත විචලනයන්ට (Overall Market Movements) ඇති සංවේදීතාවය (Sensitivity) ප්‍රකාශ කරන අගයකි."
සමාගමක බීටා අගය (Firm's Beta Value) කාලයත් සමඟ වෙනස් විය හැක්කේ මන්ද යන්න සහ එම බීටා අගයට බලපාන ප්‍රධාන කරුණු දෙක (Two Main Factors influencing Beta) හඳුන්වා එය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **04**

අ) XYZ PLC සමාගම සඳහා පහත දැක්වෙන ප්‍රාග්ධන ව්‍යුහය (Capital Structure) සහ වෙළඳපල පිළිබඳ තොරතුරු (Market Information) ලබා දී ඇත.

| | |
|---|---|
| අවදානම් රහිත අනුපාතය (Risk-free Rate – Rf) | 5% |
| වෙළඳපල ප්‍රතිලාභ අනුපාතය (Market Return – Rm) | 12% |
| බීටා අගය (Beta – β) | 1.2 |
| බදු පෙර ණය පිරිවැය (Cost of Debt – Before Tax) | 9% |
| සමාගම් බදු අනුපාතය (Corporate Tax Rate) | 30% |
| කොටස් ප්‍රාග්ධන ප්‍රමාණය (Equity Proportion) | 60% |
| ණය ප්‍රමාණය (Debt Proportion) | 40% |

ඔබ විසින් පහත දෑ ගණනය කරන්න.

i. ප්‍රාග්ධන වත්කම් මිලකිරීමේ ආකෘතිය (CAPM) භාවිතා කර කොටස් ප්‍රාග්ධන පිරිවැය (Cost of Equity) ගණනය කරන්න.
ii. බදු පසු ණය පිරිවැය (After-Tax Cost of Debt) ගණනය කරන්න.
iii. බරතැබීමේ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (Weighted Average Cost of Capital – WACC) ගණනය කරන්න.

iv. සමාගම තම ප්‍රාග්ධන ව්‍යුහය (Capital Structure) 50% ණය (Debt) සහ 50% කොටස් ප්‍රාග්ධන (Equity) ලෙස වෙනස් කරයි නම්, නව WACC අගය ගණනය කර, මෙම වෙනස සමාගමට ප්‍රයෝජනදායකද යන්න කෙටිවශයෙන් විස්තර කරන්න.

(ලකුණු 02 x 04 = ලකුණු 08)

ආ) Riverton Traders PLC සමාගම විසින් 2025 වසර සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

රු.

| | |
|---|---|
| විකුණුම් පිරිවැය (Cost of Goods Sold – COGS) | 1,095,000 |
| බඩු තොගය - සාමාන්‍ය (Average Inventory) | 150,000 |
| ශුද්ධ විකුණුම් (Net Sales) | 1,460,000 |
| ලැබිය යුතු ගිණුම් - සාමාන්‍ය (Average Accounts Receivable) | 146,000 |
| ගෙවිය යුතු ගිණුම් - සාමාන්‍ය (Average Accounts Payable) | 112,000 |

*(දින 365 යි ලෙස සලකන්න)*

ඉහත තොරතුරු භාවිතා කරමින් පහත දෑ ගණනය කරන්න. (පෙර වැඩ ඉදිරිපත් කරන්න.)

i. වෙළඳ භාණ්ඩ පිරිවැටුම (Inventory Turnover) සහ බඩු තොගයේ දින අලෙවිය (Inventory Period Days)

ii. ලැබිය යුතු ගිණුම් පිරිවැටුම (Receivables Turnover) සහ ලැබිය යුතු විකුණුම් දින (Receivables Period Days)

iii. ගෙවිය යුතු ගිණුම් පිරිවැටුම (Payables Turnover) සහ ගෙවිය යුතු ගිණුම් දින (Payables Period Days)

iv. මෙහෙයුම් චක්‍රය (Operating Cycle) සහ මුදල් චක්‍රය (Cash Cycle)

(ලකුණු 02 x 04 = ලකුණු 08)

ඉ) ලාභාංශ ප්‍රතිපත්ති අතරින් එක් ලාභාංශ ප්‍රතිපත්තියක් (01) තෝරා ගෙන, එය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**